# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1925/36 – 2015 ජූලි 28 වැනි අඟහරුවාදා – 2015.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහ පත්තුව සුළු කොට්ඨාසයේ, බෝතලේ පහලගම ගමේ පිහිටි ගම්පහ දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක ගම්/මීරි/2014/178 හා 2014.08.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0254 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

01. කැබලි අක්ෂර 'ඒ' – ගලබොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0254

උතුරට: මාර්ගය සහ ඒ. පී. එල්. ඒ. ගංගා අමරසිරි හිමිකම් කියන ගලබොඩවත්ත; නැගෙනහිරට: ඒ. පී. එල්. ඒ. ගංගා අමරසිරි හිමිකම් කියන ගලබොඩවත්ත සහ කුඩාවිදානගේ හිමිකම් කියන ගලබොඩවත්ත; දකුණට: කුඩාවිදානගේ හිමිකම් කියන ගලබොඩවත්ත; බටහිරට: කුඩාවිදානගේ හිමිකම් කියන ගලබොඩවත්ත සහ මාර්ගය.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2012/PC/319.
2015 ජුනි මස 04 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 353

1A – G 022034 – 07 (2015/ 07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*